**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙතින් ලබා ගත හැකි ව්‍යාපාර බැංකුකරණය [සිල්ලර සහ කුඩා හා මධ්‍ය පරිමාණ බැංකුකරණ අංශය] සැලසුම් සහ සේවාවන් පිළිබඳ පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛනයෙ (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛනයෙ (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර **පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [**+94(0)114711411**] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තර | දිරි දීමනා/ප්‍රවර්ධන ඇතුළු ගනුදෙනුකරුවන්ට **ලැබෙන ප්‍රතිලාභ** | **පාරිභෝගිකයින්ගෙන් අය කරන ගාස්තු/කොමිස්/පොලී** | **ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි** | **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** |
|---|---|---|---|---|
| **නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුම** | | | | |
| මෙම සැලසුම/ ගිණුම ගනුදෙනුකරුවන්ට සෑම මසකම තම ආදායමෙන් නිශ්චිත මුදලක් වෙන් කර, එකඟ වී ඇති ඉදිරි දිනයකදී එකවර මුදලක් ලබා ගැනීම සඳහා විශේෂ ඉතුරුම් ගිණුමක තැන්පත් කිරීමට හැකියාව ලබා දේ. | ඉලක්කගත කාල සීමාව පුරාවට සහතික වූ පොලී අනුපාතය. | ගිණුමක් නිසි කාලය එළඹීමට පෙර වසා දමන අවස්ථාවේදී ඇවරකිරීමේ ගාස්තුවක් අය කෙරේ.<br><br>වසර 2ක් වනවිට හෝ ඊට පෙර ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය<br><br>වසර 2 පසුව ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය සහ 1% ක් | [1] ගනුදෙනුකරු දැනටමත් ව්‍යාපාර ජංගම ගිණුමක් විවෘත කර නොමැති නම්, එකී ගිණුම සහ ඉතුරුම් ගිණුමක් ද [නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුම් ගිණුම] විවෘත කිරීම අවශ්‍ය වේ.<br><br>[2] එකඟ වූ වාරිකය ඉතුරුම් ගිණුමට වරින් වර ප්‍රේෂණය කිරීම සඳහා ජංගම ගිණුමට ස්ථාවර උපදෙස් ලබා දිය යුතුය. | • ලියාපදිංචි වාණිජ ආයතනයන්ට පමණක් මෙම ගිණුම විවෘත කළ හැකිය.<br>• පාස්පොතක් වෙනුවට ආයෝජන දැන්වීමක් ගනුදෙනුකරු වෙත නිකුත් කරනු ලැබේ.<br>• ගිණුමට රජයේ බදු අදාළ වේ.<br>• දෛනිකව පවතින ශේෂය මත පොලිය ගණනය කරනු ලබන අතර එය මාසික පදනමක් මත ගිණුමට බැර කරනු ලැබේ.<br>• ඉතිරිකිරීමේ ගිණුමෙන් මුදල් ආපසු ගැනීම් වලට හෝ අර්ධ මුදල් ආපසු ගැනීම්වලට අවසර නැත.<br>• නිසි කලට පෙර ගිණුම් වසා දමනු ලැබුවහොත් දඩයක් වශයෙන් ගාස්තුවක් අය කරනු ලැබේ. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, ...................... ට අදාල වන *සියලුම* සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.

- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් බලපැවැත්විය යුත්තේ මෙහි ඉංග්‍රීසි පිටපතයි.